# ජිහාඩ් අන්තවාදය ශ්‍රී ලංකාවේ යුද්ධය හා ඉන්දියාව
# - කුසල් පෙරේරා

තමිල් නාඩු දේශපාලනය හිටි අඩියේ අපේ රටේ දේශපාලනයට බලපාන්නා වූ වැදගත් සාධකයක් බවට පත්ව ඇත. තමිල් නාඩු දෙමළ දේශපාලනය ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව වෙනුවෙන් එවැනි උද්ඝෝෂණික තලයකට එසවෙනු ඇතැයි ඉන්දීය මහ ආණ්ඩුවේ නායකයින් වුව නොසිතු සෙයකි. එහෙත් එකට වාඩි වී කිසිදු දේශපාලනයක් ගැන කතා කරන්නට සූදානම් නැති කරුණානිධි හා ජෙයලලිතා වෙන වෙන ම ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව ගේ සහායට හඬ නගති. ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව වෙනුවෙන් මහ ආණ්ඩුවට බල කරන්නට කරුණානිධි තමිල් නාඩුවේ දෙමළ පක්ෂ සමුළුවක් කැඳ වූ විට ඊට සහාය නොදුන් ජෙයලලිතා සහ වයිකො ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව ගේ සහායට එදිනම චෙන්නායි නගරයේ උපවාසයක් පැවැත් වූහ.

ඒ සමග අපේ රටට බලපාන්නා වූ කලාපීය හා ජාත්‍යන්තර සබඳතාවන් නව හැඩයක් සමඟින් ඉස්මත්තට පැමිණෙමින් තිබේ. එහි දී වැඩි අසීරුතාවයකට මුහුණ පා ඇත්තේ ඉන්දියාව ය. ඉන්දියාවට තම කලාපීය බලය තහවුරු කර ගැනීමේ දිගු කාලීන අපේක්ෂාවන්ට පිටතින් ශ්‍රී ලංකාව හා ගනු දෙනු කළ නොහැක. එහෙත් ඒ වෙනුවෙන් ඉන්දියාව මෙතෙක් මැදිහත් වූ ආකාරයේ තිබූ බරපතල සීමාවන් නැතිනම් අවස්ථාවාදී වුවමනාවන් නිසා අද ඔවුන් ද තමිල් නාඩු දේශපාලනයේ තෙරපුම වාව ගැනීමේ අපහසුවකට පත් ව ඇත.

ඉන්දියාවේ විදේශීය ප්‍රතිපත්ති සම්පාදකයින් අතර මුල් බැස ඇති ඉතා දැඩි එල්.ටී.ටී.ඊ. විරෝධයක් සමඟින් ඔවුන් ගේ ශ්‍රී ලංකා මැදිහත්වීම සමනය කළ නොහැකි පරස්පර ගහණ මැදිහත්වීමක් බවට පත් විය. ඉන්දීය විදේශ

ප්‍රතිපත්ති සම්පාදකයින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අවධානයට නොගත් සාධක කිහිපයකි. ඉන් පළමු වැන්න වූයේ නේරු-ගාන්ධි යුගයේ වූ සාම්ප්‍රදායික විදේශ පිළිවෙතක් අනුගමනය කළ හා රුසියාවට වැඩි බරක් දැක්වූ ඉන්දියාව අද නොමැති බව ය. අද ඉන්දියාව ජෝජ් බුෂ් සමග න්‍යෂ්ටික ගිවිසුමකට ඇතුළු වූ ඉන්දියාවකි. එනිසා ම ඊට අකමැති රටවල් හා ගනු දෙනු කිරීමේ පහසුව රාජපක්ෂ පාලනයට නිතැතින්ම ලැබෙන්නකි. රාජ්‍යතාන්ත්‍රිකව ඉරාණය, චීනය හා රුසියාව සමගත් වෙළඳ ගනුදෙනුවල දී මැලේසියාව සමඟත් වැඩි සබඳතාවයන් වෙත යොමු විමේ එක් අවකාශයක් එමඟින් රාජපක්ෂ පාලනයට ලැබුණි. පාකිස්ථානය හා සමීපව ගනු දෙනු කිරීමේ අවකාශය ශ්‍රී ලංකාවට හැම විටම තිබුණකි.

එයටම එකතු වූ අනෙක් සාධකය රාජපක්ෂ පාලනයට සැපයුනේ මානව හිමිකම් උල්ලංඝණය හා ප්‍රජාතන්ත්‍රවාදය විකෘති කිරීම සමඟින් ය. යුද්ධය වෙනුවෙන් සිංහල සමාජය හැඩ ගැන් වූ රාජපක්ෂ ආණ්ඩුව යටතේ දිගින් දිගටම සිදුවූ පැහැර ගැනීම්, අතුරුදහන්විම්, ඝාතන, කප්පම් ගැනීම් සහ

දෙමළ ජනතාවට නිදහසේ කොළඹට පැමිණ නතරවීමට පැන වූ තහංචි සමඟ බටහිර රටවල් රාජපක්ෂ ආණ්ඩුවට නැගූ චෝදනා සහ තර්ජනවලින් නිදහස්ව ගොඩ නගා ගත හැකි වූ ජාත්‍යන්තර සබඳතාවයන් තිබූයේ ඉරාණය, චීනය, රුසියාව හා පාකිස්ථානය වැනි රටවල් සමඟින් ය. ඒ හේතුන් සමග බටහිර රටවල් කතා කළ තහංචිවලින් නිදහස්ව පවත්වා ගත හැකි වූ විදේශ සබඳතාවයන් සඳහාත් මේ රටවල් රාජපක්ෂ පාලනයට යහපත් විය. ඒ වගේ ම, බටහිර රටවල් හා සමීප වන ඉන්දියාවට එරෙහිව මේ රටවලට ද ශ්‍රී ලංකාව වැදගත් විය. රාජපක්ෂ ආණ්ඩුව විසින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට එරෙහිව දියත් කෙරෙන යුද්ධයක් ලෙස උතුරු නැගෙනහිර යුද්ධය හංවඩු ගැසීමත් මේ රටවලින් ආධාර ලබා ගැනීම සාධාරණය කිරීමක් විය.

ඉන්දියානු උපදේශකයින් නොතැකූ දේශපාලන සන්දර්භය වූයේ, මේ නව හැඩ ගැසීම ය. මේ සන්දර්භයෙ හි ඔවුනට වැදගත් වූයේ පාකිස්ථානයෙන් රාජපක්ෂ ආණ්ඩුව ලබා ගත් යුධ ආධාර පමණි. ඒ අනුව ඉන්දියාව ගණන් හැදුයේ පාකිස්ථානයට වඩා හොඳින් රාජපක්ෂ පාලනයට යුද ආධාර ලබා දීමට ය. එය ඔවුන් ගේ එල්.ටී.ටී.ඊ. විරෝධය සමඟින් ද කදිමට ගැළපුණකි.

එහෙත් එය ඔවුනට ප්‍රසිද්ධියේ කළ හැක්කක් නොවීය. තමිල් නාඩු දේශපාලනය උරණ නොකර ගෙන කළ යුතු වූ හෙයින් ඉන්දීය මහ ආණ්ඩුව පසු ගිය දෙවසර තුළ රාජපක්ෂ ආණ්ඩුවේ යුද්ධයට ආධාර කරන්නට වූයේ නිහඬ රහස් පිළිවෙතකට ය. එල්.ටී.ටී.ඊ. යට එරෙහිව ඉන්දීය යුධ තාක්‍ෂණය ද බුද්ධි අංශ තොරතුරු සැපයීම ද ඒ අනුව සිදු වුණි. ඒ වෙනුවෙන් ඉන්දියාව ඉල්ලා සිටියේ, අවම වශයෙන් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ක්‍රියාවට නැඟීම ය. ආණ්ඩුව සමඟ ඉන්නා ඩග්ලස් ලා, සංගරී ලා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංංශෝධනය වෙනුවෙන් ඉදිරිපත් වනු ඇතැයි ඉන්දීය උපදේශකයින් කල්පනා කරන්නට ඇත. එහෙත් ඔවුන් නැවතත් තේරුම් නොගත්තේ ඩග්ලස් ගේ සිට සංගරී හරහා කරුණා අම්මාන් සහ පිල්ලෙයාන් දක්වා සියල්ලන් ම මේ අණ්ඩුවෙන් යැපෙන සහ එනිසා ම මේ ආණ්ඩුවට අවශ්‍ය ලෙස කතා කළ යුතු දෙමළ ඉත්තන් බව ය. එහෙයින් ඒ හැම දෙනාම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොතකා සිටින්නේ, ඔවුන් ගේ හෘදය සාක්ෂිය අනුව නොව ආණ්ඩුවේ වුවමනාව අනුව ය.

ඉන්දීය උපදේශකයින් තේරුම් නොගත් තවත් වැදගත් දේශපාලනයක් ද මෙහි ඇත. ඔවුන් බලාපොරොත්තු වූ ආකාරයට එල්.ටී.ටී.ඊ. ය යුදමය වශයෙන් පරාජය කිරීම සඳහා රාජපක්ෂ පාලනය විසින් සහතික කර ගත යුතු වූ සමාජ මතවාදය සැපයුණේ සිංහලවාදී මතවාදයෙනි. රාජපක්ෂ ජනාධිපති බලයට එන්නේ ද එම සිංහල මතවාදය ට අවශ්‍ය ඒකීය රාජ්‍ය ගොඩ නැඟීමට ය. එහෙයින් ඉන්දීය උපදේශකයින් බලාපොරොත්තු වූ එල්.ටී.ටී.ඊ. ය විනාශ කිරීම හා සිංහල මතවාදයට අවශ්‍ය ඒකීය රාජ්‍ය තහවුරු කිරීම අයත් වන්නේ එකම න්‍යාය පත්‍රයට ය. ඔවුන් සාමාන්‍ය දෙමළ ජනතාව වෙනුවෙන්

බලාපොරොත්තු වූ බලය බෙදීම ඒ න්‍යාය පත්‍රයට අදාළ නොවූවකි. රාජපක්ෂ දේශපාලනයේ හරය එය ය.

එනිසා යුධමය ආධාර දෙනු ලැබුවත්, ඉන්දීය ආණ්ඩුව ඉල්ලා සිටි බලය බෙදීමට රාජපක්ෂ පාලනය කිසි විටෙක සූදානම් නොවී ය. ඉන්දීය ආණ්ඩුවේ එම දේශපාලන ඉල්ලීම අත හැර දැමීමට රාජපක්ෂ ආණ්ඩුව සතු හයියක් ද තිබිණ. ඒ ඉන්දීය යුධ ආධාර නිල වශයෙන් ලබා දීමට ඉන්දීය මහ ආණ්ඩුව ඉදිරිපත් නොවූයෙනි. රහසිගතව කෙරුණු ගනු දෙනු සම්බන්ධව දෙපාර්ශවයටම අයිතිවාසිකම් කිව නොහැකි වා සේම ලබා ගන්නා ද ඒ වෙනුවෙන් බැඳීමකට යටත් නොවන්නේ ය. මෙය පැහැදිලි වූයේ 15 වන සාක් සමුළුව කොළඹ පැවැත්වීමට ඉන්දීය අගමැති ගේ පැමිණීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව පෙන් වූ සූදානම සමඟින් ය. ඉන්දීය ආණ්ඩුවේ දැඩි වුවමනාව මත සූදානම් කළ සෙපා ගිවිසුම අවසන් මොහොතේ රාජපක්ෂ ආණ්ඩුව විසින් කිසිදු පැකිලීමකින් තොරව අත හැර දමනු ලැබී ය. එවගේ ම ඉන්දීය ආණ්ඩුවෙහි ඉල්ලීම මත වාර්ගික අර්බුදය සඳහා විසඳුම් ලෙස 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සර්ව පාක්ෂික සමුළුවෙහි යෝජනාවක් මත ඉදිරිපත් කර ඒ වෙනුවෙන් උද්ඝෝෂණය කිරීමට විශේෂ ඇමති කමිටුවක් ද පත් කර, සාක් අමුත්තන් සමුළුව අවසන් කර පිටව ගිය විගස එය අත හැර දමනු ලැබිණ. ඒ කිසිවක් වෙනුවෙන් රාජපක්ෂ ආණ්ඩුවට බල කිරීමට ඉන්දීය ආණ්ඩුවට නොහැකි වූයේ ඔවුන් එල්.ටී.ටී.ඊ. ය විනාශ කිරීම සඳහා රාජපක්ෂ ආණ්ඩුව සමඟින් ගනු දෙනු කරනු ලැබූයේ තමිල් නාඩුවට හොරෙන් කෙරුනු රහස්‍ය ගනු දෙනුවක් ලෙස හෙයිනි.

එහෙත් අද ඉන්දීය ආණ්ඩුවට එළි පිට දෙමළ ජනතාව වෙනුවෙන් තමිල් නාඩු දේශපාලනයේ වුවමනාවන් ඉටු කරන්නට සිදුවීම ඔවුන් මෙතෙක් ගොඩ නඟා ගෙන සිටි සූත්‍රය කණ පිට හැරවීමකට හේතු වන්නකි. එය ඔවුන් ගේ දෙවන වුවමනාව ද නිශේධනය කරන්නකි. ශ්‍රී ලංකාවේ හමුදාමය ආයතන පාකිස්ථානයේ බලපෑමට යටවීම වළකා ගැනීමත්, ශ්‍රී ලංකාවට හමුදාමය ආධාර සැපයීමෙහි දී ඉන්දීය ආණ්ඩුවෙහි ප්‍රධාන වුවමනාවක් විය. එය පාකිස්ථානය සම්බන්ධව ඇති ඉන්දීය අධි මානසිකත්වය පිළිබඳ ගැටළුවක් ම නොවේ. එය ඉන්දියාවේ ස්ථාවරත්වයට බලපාන්නා වූ ඉස්ලාමීය මූලධර්මවාදය ඉන්දීයාව අවට ව්‍යාප්ත වීම පිළිබඳව ඔවුන් මුහුණ දෙන බරපතළ දේශපාලන ගැටළුවකි.

අප ගේ කලාපයෙ හි ඉස්ලාමීය මූලධර්මවාදය ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් පාකිස්ථානයට එරෙහි චෝදනා හුදු ප්‍රචාරකවාදී චෝදනා නොවේ. අල් ඛයිඩා සංවිධානය හා ඉතා සමීප සම්බන්ධකම් ඇති හා ඇෆ්ගනිස්ථානයේ තලේබාන්වරුන් හා සමීපව කටයුතු කරන පාකිස්ථානු හර්කාත්-උල්-ජිහාඩ්-අල්-ඉස්ලාමි (හූජි) සංවිධානය බංග්ලාදේශයේ සන්නද්ධ ඉස්ලාමීය සංවිධාන සඳහා පුහුණුවීම් කඳවුරු සංවිධානය කරනු ලබන්නේ යැයි ප්‍රසිද්ධ චෝදනා

ඇත. ඔවුන් බංග්ලාදේශයේ ඉන්නා බුරුම මුස්ලිම් අනාථයින් වන රොහිංග්යා මුස්ලිම්වරුන් ඉස්ලාමීය ගෙරිල්ලාවරුන් ලෙස පුහුණු කරන්නේ යැයි ද තොරතුරු ඇත. මේ වන විට රොහිංග්යා මුස්ලිම් ගෙරිල්ලා කණ්ඩායම් තලේබාන්වරුන් සමඟ එක්ව ඇෆ්ගනිස්ථානයේ සටන් කරන බව සනාථ වූවකි. ඉන්දීය අසාම් ප්‍රාන්තයේ මුස්ලිම් සන්නද්ධ කණ්ඩායමක් වන මුල්ටා ගෙරිල්ලාවරුන් මීට වසර 06 ට පෙර මෙම රොහිංග්යා සන්නද්ධ කණ්ඩායම් සමග ඉස්ලාමීය මූලධර්මවාදී හවුලක් පවත්වා ගත්තේ යැයි වාර්තා තිබිණ.

ඊටත් පෙර 1988 දී නව දිල්ලියේ පාකිස්ථානු මහ කොමසාරිස් කාර්යාලයේ ස්ථාන බාර නිලධාරී ලෙස කටයුතු කළ බ්‍රිගේඩියර් සහීර්-උල්-ඉස්ලාම්-අබාස් සන්නද්ධ ඉස්ලාමීය හූජි සංවිධානය හා ඉතා සමීප සම්බන්ධකම් පැවැත් වූ බවට හා ඔහු හමුදා කුමන්ත්‍රණයකට මුල පුරා ඇතැයි පාකිස්ථානු ආරක්‍ෂක සේවා තොරතුරු තිබී යැයි ඉන්දියානු ආණ්ඩුව ඔහු ව ඉන්දියාවෙන් වහා පිට මං කළේ ය. එවගේ ම පාකිස්ථානු හමුදාව සන්නද්ධ ඉස්ලාමීය කණ්ඩායම් සමග පවත්වා ගන්නා රහස්‍ය සංවිධානාත්මක එකගතාවයන් පිළිබඳව ඉන්දීය ආරක්‍ෂක අංශ ඉතා දැඩි මත දරති. ඒවා පාකිස්ථානය හා ශ්‍රී ලංකාව අතර ගොඩ නැගෙන හමුදාමය ඇයි හොඳැයිය ගැන දක්වන්නේ බරපතළ කණසල්ලකි.

මේ එවැන්නක් ගැන ශ්‍රී ලංකාව පවා ඉතා බරපතළ අවධානයක් යොමු කළ යුතු සටහනකි.

"සවුදි අරාබියාවේ දී අබු හම්සා ව හමුවූයේ (තමිල් නාඩු වේ මුස්ලිම් ආරක්‍ෂක බලකාය සම්බන්ධව පරීක්‍ෂණ කළ පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබූ) හමීඩ් බක්රි ය. ඔහු සමග සබාරියා නම් අයෙකු ද විය. අනතුරුව ඔවුහු තවත් හමුවක් සඳහා ශ්‍රී ලංකාවට ද ගියහ. එහෙත් එම සාකච්ඡාව කිසියම් හේතුවක් නිසා පැවතියේ නැත. වසර ගණනාවක් පුරා මුම්බායි දකුණු ඉන්දියාව හා බොහෝ විට නැගෙනහිර ශ්‍රී ලංකාව අතර රහස්‍ය ජිහාඩ් ක්‍රියාකාරකම් සඳහා ජාලයක් පැවති බවට තොරතුරු ඇත. ඒ වෙනුවෙන් SIMI සහ LET සංවිධාන (මේ සංවිධාන දෙක ම පාකිස්ථානයේ ක්‍රියාත්මක වන්නෙහිය) එක්ව හෝ වෙන් වෙන් ව ක්‍රියාත්මකව ඇත. ඒ සඳහා මූල්‍යමය සහාය සවුදි අරාබියේ සහ ගල්ෆ් රටවල ඉන්නා ඉන්දීය හා පාකිස්ථානු ජිහාඩ් ක්‍රියාධරයින් ගෙන් ලැබී ඇත." (Intelibriefs – 'Jihadi Terrorism in South India – External Motivators' / Paper 271 – B. Raman)

එවැනි පසු බිමක ඉන්දියාව දැන් ඇත්තේ හෙයියම්මාරුවක ය. එල්.ටී.ටී.ඊ. ය හමුදාමය වශයෙන් විනාශ කිරීමට ඉන්දියාව ගත් රහස්‍ය පිළිවෙත රාජපක්‍ෂ ආණ්ඩුවට ලබා දී ඇත්තේ ඔවුන් ගෙන් ස්වාධීන වූ හයියකි. එය රාජපක්‍ෂ ආණ්ඩුවට සිංහල සමාජයේ නායකත්වය වශයෙන් ශක්තිමත් වන්නට ද අවකාශයක් ලබා දී ඇත. අද වන විට එයට ප්‍රධාන විපක්‍ෂයේ නිවටකම ද

එකතු වී ඇත. අද එජාපයට කතා කළ හැකි විදේශ රටවල් රාජපක්ෂ ආණ්ඩුවට බලපෑම් කළ හැකි පෙළ ගැසීමක නැත. ඒ රටවල් අද මුහුණ දෙන මූල්‍ය අර්බුදය ද ඔවුන් ගේ මහා මාන්‍ය පෙනුම හැල්ලු කර ඇත. එම අතර මං වීම නිසා එජාප නායකත්වය අද යන එන මං නැති උමතුවක ගිලී ඇත. ඒ හේතුවෙන් අද ඉන්දියාවට විපක්ෂය හරහා ආණ්ඩුවට බලපෑම් කිරීමේ ඉඩ කඩක් ද නැත.

ඉන් ගොඩ ඒමේ මාවතක් කපා ගැනීම ඉන්දියාව ඔවුන් ගේ වගකීම ලෙස බාර ගත යුත්තකි. ඒ සමඟ අපට බාර වන වගකීම කවරේ ද ? අපට එවැනි වගකීමක් ඇතැයි පේන තෙක් මානයේ නැත. අප නතර වන්නේ රාජපක්ෂ පාලනයේ ජයග්‍රහනය මත සියල්ල විසඳා ගත හැකිය යන මිථ්‍යාව සමඟින් ය. ඒ මිථ්‍යාව අද හෙට බිඳ වැටෙන්නක් ද නොවේ. දිනකට රුපියල් දස ලක්ෂ 456 ක් යුද්ධය වෙනුවෙන් පමණක් වැය කිරීම කිසිදු ප්‍රශ්නයක් නොවන සිංහල සමාජයට, එවැනි මුදලක් දින පතා වසරකට වැඩි කාලයක් වැය කර දෙලක්ෂයක් පමණ වන අපේ ම අහිංසක පුරවැසියන් අනාථයින් බවට පත් කළ පසු එයත් යන එන මං නැතිව පරාජයේ අභිමුව ඉන්නා යැයි කියන එල්.ටී.ටී.ඊ. යේ ගිණුමට වැය කරන්නට සූදානම් සිංහල සමාජයට, මේ වන විට 26,000 කට වැඩි අහිංසක ළමුන් ගේ අධ්‍යාපනය අහිමි කර එය නොදන්නා ලෙස ඉන්නා සිංහල සමාජයකට, ඒ වෙනුවෙන් මියගිය සොල්දාදුවන් සිය ගණන නැතිනම් දහස් ගණන කොපමණ දැයි නොඅසා ඔවුන්ට වීර සෙබළ ලේබලය අලවා අමතක කර ඉන්නා සිංහල සමාජයට, හැම යුධ ප්‍රහාරයකින් ම වැන්දඹුවන් බවට පත් කෙරෙන හා පත් වන තරුණියන් ගණන නොදන්නා සිංහල සමාජයට, පියා නැතිව අසරණ වූ අහිංසක දරුවන් කොතෙක් දැයි තවමත් නොදන්නා නොතකන සිංහල සමාජයට, අවසාන සාධාරණ විසඳුමක් වෙනුවෙන් වගකීමක් තිබිය නොහැක.

එබැවින් අද මේ සමාජය ඉන්නේ ඉන්දියාව හා ගනු දෙනුවක් ඇතැයි ද එය බේරා ගැනීමෙන් අප ගේ සියලු ප්‍රශ්න විසඳෙනවාය යන මිථ්‍යාව මත මිස අප ගේ අනාගතය වෙනුවෙන් ඉන්දියාව හා කළ යුතු ඇත්ත ගනු දෙනුව ගැන අදහසක් ඇතිව නොවේ. අප ගේ අවාසනාවට ඉන්දියාව ද දෙමළ ජනතාව ගේ ප්‍රශ්නය අල්ලා ගෙන ඇත්තේ එල්.ටී.ටී.ඊ. ය හා ඔවුන්ට ඇති ගනු දෙනුවක් ලෙසින් පමණි. එහෙත් ඉන් වැඩි අවදානමක් ඇත්තේ ඉන්දියාවට නොව අපට බව අමතක නොකළ යුත්තකි. මෙය නිසියාකාරව ලිහා නොගතහොත් ඉස්ලාමීය මූලධර්මවාදී ගැටළුව ද එමඟින් අප අලුතින් අප ගේ ඔඩොක්කුවට දමා ගන්නා තවත් යුද අනතුරක් වන හෙයිනි.